## ආගම හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරුගේ ශ්‍රී ලංකා සංචාරයේ මූලික සොයා ගැනීම්

2019 අගෝස්තු 26 කොළඹ දී

හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ ආගම හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු වශයෙන් ශ්‍රී ලංකාණ්ඩුවේ ආරාධනය අනුව ආගම හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ තත්වය ඇගයීම සඳහා අගෝස්තු 15-26 දක්වා රටේ සංචාරය කිරීමට හැකිවීම ගැන මම සතුටට පත්වෙමි. මගේ සංචාරය අභාවප්‍රාප්ත අස්මා ජෙහන්ගීර් 2005 දී ශ්‍රී ලංකාවේ සියලු දෙනා ආගම හෝ විශ්වාසයේ නිදහස භුක්ති විඳීමේ දී පවතින හෝ මතු වෙමින් පවතින කිසියම් බාධා ඇත්නම් ඒවා හඳුනා ගැනීමට කළ සංචාරයෙන් පසුව ආගම හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ එක්සත් ජාතින්ගේ මැන්ඩේට් අධිකාරිය හිමි අයෙකු මේ රටේ සිදු කරන දෙවන සංචාරයයි.

පළමුවෙන්ම පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් සහ ඉන් පසුව හටගත් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් මිය ගිය අය සිහි කරනු වස් මගේ ආචාරයත් ඔවුන්ගේ ආදරණීයන්ට මගේ සංවේගයත් පුද කරනු කැමැත්තෙමි. තුවාල ලැබූවන්ට ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන මම මෙම සිත්පිත් නැති ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් සියලු දෙනාටම සහානුකම්පාව පළ කරන්නෙමි.

පාස්කු ඉරිදා සිදු වූ බෝම්බ ප්‍රහාර සහ ඉන් අනතුරුව හටගත් ප්‍රචණ්ඩත්වයෙන් පැන නැගුනු ගැටලු ආමන්ත්‍රණය කිරීමේ දී අධිකාරීන්ට අභියෝගවලට මුහුණ දීමට සිදුව ඇති නමුත් පසු ගිය වසරේ සිට සැලසුම් කළ මගේ සංචාරය මෙම අවස්ථාවේ දී සිදු කිරීමට ආණ්ඩුව තීරණය කිරීම ගැන මගේ කෘතඥතාවය පුද කරන්නෙමි. මගේ සංචාරයට පහසුකම් සැපයීමෙන් ආණ්ඩුව දැක් වූ සහයෝගයත්, කොළඹ එක්සත් ජාතීන්ගේ කණ්ඩායම ලබා දුන් ප්‍රබල සහායටත් ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.

මගේ සංචාරයේ දී පාර්ලිමේන්තුවේ කතානායක, විරුද්ධ පක්ෂයේ නායක, විදේශ කටයුතු, හින්දු කටයුතු, බෞද්ධ කටයුතු පිළිබඳ ඇමතිවරුන් සහ නීතිපති, ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ ලේකම්, මුස්ලිම් කටයුතු හා සම්බන්ධ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හමු වූයෙමි. විදේශ ලේකම් ගේ ප්‍රධානත්වයෙන් අදාල අමාත්‍යංශ සහ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක්රැස් කොට පැවැත් වූ ආණ්ඩුවේ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමකට ද මම සහභාගි වූයෙමි. වැඩි දුරටත් මම ජාතික සමගිය සහ සන්හිඳියා කාර්යංශය සහ ජාතික මානව හිමිකම් කොමිසම යන ආයතනවල සභාපතිවරුන් ද හමු වූයෙමි. කොළඹින් බැහැරව මම උතුරු පළාතේ සහ වයඹ පළාතේ ආණ්ඩුකාරවරුන් ද හමු වූයෙමි. මගේ ක්ෂේත්‍ර සංචාරයෙන් වවුනියාව, මුලතිවු යාපනය, ත්‍රිකුණාමලය, කන්නියාව, මඩකලපුව, කාත්තන්කුඩි, මහනුවර, දිගන, කුරුණෑගල, කොට්ටඹ පිටිය, පුත්තලම, මීගමුව, කොට්ටාරමුල්ල, පස්යාල, දිවුලපිටිය, මිනුවන්ගොඩ සහ ජාඇල ආවරණය විය. පුන්තෝට්ටම් සහ පස්යාල දී තම මුල් රටේ දී ආගමික වධහිංසාවන්ට මුහුණ දුන් සරණාගතයන් මුණ ගැසුනෙමි. වැඩි දුරටත් මම විවිධ ආගමික ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන සහ සමීක්ෂණ ආයතනවල නියෝජිතයන් ද හමු වූයෙමි.

ඔබගේ අවධානයට යොමු වනු ඇතැයි මම අපේක්ෂා කරන සමහර ප්‍රධාන නිරීක්ෂණ ඇතුළත් මගේ මූලික සොයා ගැනීම් අද ඉදිරිපත් කරමි. අවසාන නිල වාර්තාව 2020 මාර්තු මස මානව අයිතිවාසිකම් කවුන්සලයට ඉදිරිපත් කරනු ඇත. මගේ අවසාන වාර්තාව සකස් කිරීමේ දී මෙම මූලික නිර්දේශ ගැන වැඩි තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගැනීමට ආණ්ඩුව සහ අදාල පාර්ශ්වකරුවන් සමග දිගටම උපදේශනයෙන් සම්බන්ධවීමටත් වැඩ කිරීමටත් කටයුතු කරනු ඇත.

### 1. ආගමික භූ දර්ශනය සහ දේශපාලන වර්ධනය

2012 ජන සංගනනය අනුව ජන සංඛ්‍යවෙන් 74.9%ක් සිංහල වන අතර ඔවුන් වැඩි වශයෙන්ම බෞද්ධ හෝ සුළුතර ක්‍රිස්තියානි ප්‍රජාවට අයත් ය. ජන සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 15.3%ක් දෙමළ වන අතර ඔවුන් ප්‍රධාන වශයෙන්ම හින්දූන් ය. ඊට විවිධ ක්‍රිස්තියානි නිකායන්ට අයත් ඇතුළත් ය. තුන්වැනි විශාල වාර්ගික කණ්ඩායම වන මුස්ලිම් ප්‍රජාව ජන සංඛ්‍යවෙන් 9.2%ක් වේ. ශ්‍රී ලංකාවේ විශාලතම ආගමික කණ්ඩායම බෞද්ධ වන අතර 70.2%ක් එම ආගම අදහති. එමෙන්ම හින්දූන් 12.6%, මුස්ලිම් 9.7% ක්‍රිස්තියානි භක්තිකයන් 7.4% ක් ද වෙති. සංගණනය අනුව බෙහෝ මුස්ලිම් ආගමිකයන් සුන්නි වන අතර ක්‍රිස්තියානි භක්තිකයන් රෝමානු කතෝලික වන බව පෙන්නුම් කරයි. බහායි, ෂියා, ( බෝරා ප්‍රජාව) සුෆි, අහ්මඩි, ජෙහෝවා භක්තිකයන්, මැතෝදිස්ත, පෙන්ටකොස්ත සහ එවැන්ජලික සුළු සංඛ්‍යාවක් ද වෙති. සම්ප්‍රදායික ඇදහීම් කරන ආදිවාසි ප්‍රජාවක් වන වැදි ජන කණ්ඩායමක් ද වේ.

UNITED NATIONS HUMAN RIGHTS SPECIAL PROCEDURES
SPECIAL RAPPORTEURS, INDEPENDENT EXPERTS & WORKING GROUPS

මෙම රට ආරක්ෂාව පිළිබඳව ඉමහත් අභියෝග මතු කළ දීර්ඝ අභ්‍යන්තර ගැටුමක් පසු කර ඇත. ගැටුමේ විකාශය සහ එම සිද්ධීන් පිළිබඳ තොරතුරු මානව අයිතිවාසිකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නොයෙකුත් වාර්තාවලින් විස්තර කර ඇත.

කෙසේ වුවත් වාර්ගික ගැටුමේ දෝංකාරය දේශපාලන, සමාජ සහ ආර්ථික ක්ෂේත්‍රවල දිගටම දැනෙන අතර එය ආගම හෝ විශ්වාසයේ නිදහසට ඇති අයිතිය භුක්ති විඳීමට බලපෑම්කරයි. සංක්‍රාන්තික යුක්තියට අදාලව පශ්චාත් ගැටුම් පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කිසියම් ප්‍රගතියක් අත් කර ගෙන ඇති නමුත් විශේෂයෙන්ම වගවීම පවත්වා ගැනීම මෙන්ම නැවත සිදු නොවීම සහතික කිරීම ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු හිඩැස් පවතී.

2015 පැවති ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් මූලික නිදහස සහ සියල්ලන් ඇතුළත් කර ගැනීම, යුක්තිය සහ ශ්‍රී ලංකාවේ සියලු ජනතාවගේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම ඇතුළත් නීතියේ ස්වාධිපත්‍යය ශක්තිමත් කිරීමට පොරොන්දු වූ ආණ්ඩුවක් බලයට පත් කෙරිණ. එය ශ්‍රී ලංකාණ්ඩුවේ සම අනුග්‍රහය ඇතිව සංහිඳියාව, වගවීම සහ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මානව අයිතිවාසිකම් කවුන්සලයේ යෝජනා අංක 30/1 සම්මත කර ගැනීමට හේතු විය. එම යෝජනාවෙන් ආණ්ඩුව ශක්තිමත් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට කැප වී සියලුම ශ්‍රී ලාංකිකයන්ට ආගම, විශ්වාසය හෝ වාර්ගිකත්වය නොසලකා තම මානව අයිතිවාසිකම් පූර්ණව භුක්ති විඳීමට හිමිකම ගැන නැවතත් සහතික විය.

ඉස්ලාමීය ත්‍රස්තවාදී කණ්ඩායම් තුනක් සංවිධානය කෙළේයැයි සැලකෙන 2019 අප්‍රේල් 21 මෑතක එල්ල කළ ත්‍රස්තවාදී ප්‍රහාරවලින් රටේ තත්වය බොහෝ සෙයින් වෙනස් විය. මෙම ප්‍රහාරවලින් 250කට වැඩි සංඛ්‍යාවක් මිය ගිය අතර ඒවා අභ්‍යන්තර ගැටුම් නිමාවීමෙන් පසුව සිදු වූ වඩාත්ම මාරාන්තික සිද්ධීන් ය.

ඊට ප්‍රතිචාර වශයෙන් ආණ්ඩුව හදිසි තත්වයක් ප්‍රකාශ කොට සැකකරුවන් අත් අඩංගුවට ගෙන දීර්ඝ කාලයක් රඳවා ගැනිම සඳහා ආරක්ෂක හමුදාවලට පුළුල් බලතල ලබා දෙන ලදී. හදිසි තත්වය යටතේ සමහර ආගමික ප්‍රජාවන් ආගම හෝ විශ්වාසය පිළිපැදීමේ දී සහ ප්‍රකාශ කිරීමේ දී බලපෑමට ලක් විය. නොයෙකුත් ආගමික ප්‍රජාවන් අතර සැකය සහ අවිශ්වාසය වැඩි වී මුස්ලිම් ප්‍රජාවට එරෙහි වෛරී කතා සහ ප්‍රචණ්ඩත්වය උත්සන්න විය. තම ආගමික හෝ විශ්වාසය මත පදනම්ව තමන් වැඩියෙන් හිරිහැර කිරීම්වලට සහ වින්දිතයන් බවට වැඩියෙන් පත් කරන තත්වයකට මුහුණ දීමට සිදු වූයේයැයි බොහෝ දෙනකු පැමිණිලි කළහ. හදිසි තත්වය දැන් ඉවත් කර ඇත.

## 2. ශ්‍රී ලංකාවේ සාධනීය වර්ධනයන්

සාමකාමී රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ නිදහසට ඇති අයිතිවාසිකම් පිළිබඳ විශේෂ වාර්තාකරු ඔහුගේ ශ්‍රී ලංකා සංචාරය ( 2018 ජුලි 18 26 ) අවසානයේ නිකුත් කළ වාර්තාවේ සඳහන් කළ ආකාරයට 2015 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19 වැනි සංශෝධනය හඳුන්වා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට සැලකිය යුතු මුලපිරුම් ගෙන ඇත. [1] ආණ්ඩුව ස්වාධීන කොමිසන් සභාවලට සහ ආයතනවලට සාමාජිකයන් අනුමත කිරීමේ දි සහ නම් කිරීමේ දී මෙන්ම නොයෙකුත් තනතුරුවලට සභාපතිවරුන් තෝරා ගැනීමේ භූමිකාව වැඩි දියුණු කිරීමත් සමග ව්‍යවස්ථාදායක සභාව ප්‍රතිස්ථාපනය කිරීමට සාධනීය පියවර ගෙන ඇත. මානව හිමිකම් කොමිසමේ වැඩ කටයුතුවලට පැරිස් මූලධර්මවලට අනුව ඒ (A ) තත්වය ලබා දී ඇත. වැඩි දුරටත් ආණ්ඩුව මානව අයිතිවාසිකම් කවුන්සලයේ යෝජනා අංක 30/1ට අනුකූලව අතුරුදහන් තැනැත්තන් සඳහා වූ කාර්යාලය ( 2016) සහ හානි පූරණ කාර්යාලය (2018) ස්ථාපිත කර ඇත.

පොදුවේ රටේ සංහිඳියාව සහ සාමකාමී සහජීවනය ප්‍රවර්ධනය කිරීමට නව මුල පිරුම් ගණනාවක් දියත් කර ඇති බවට වාර්තා මා වෙත ලැබිණ. ශ්‍රී ලංකාවේ ප්‍රජා සහ ආගමික එකමුතුව පිළිබඳව අධ්‍යයනය කොට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය සහ විපක්ෂයේ සාමාජිකයන් 24කින් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම ද මම සැලකිල්ලට ගත්තෙමි. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පත් කිරීමෙන් පසුව එය පවතින අභියෝග හඳුනා ගෙන සමහර

[1] https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=24818&LangID=E

අභියෝග ජය ගැනීම[2] සඳහා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කොට යෝජිත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් ද ඉදිරිපත් කර ඇත. වැඩි දුරටත් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව 2019 අප්‍රේල් මාසයේ දි පැවැත් වූ සියලු ඇදහීම් සහ සර්ව පක්ෂ විශේෂ සම්මන්ත්‍රණයේ දී ''දියවන්නා ප්‍රකාශනය'' දියත් කරන ලදී. එහි දී වෙනත් කරුණු අතර''ජනාධිපති, අගමැති, විපක්ෂ නායක ඇතුළත් සියලු පක්ෂ නායකයන් පටු දේශපාලන, ආගමික හෝ පක්ෂ වෙනස් තම් නොසලකා සියලු පුරවැසියන්ට බියෙන් හා සැකයෙන් තොරව ජීවත්වීම තහවුරු කිරීමට සහ රටේ සහ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට එකිනෙකා සමග සහයෝගයෙන් වැඩ කිරීමේ අවශ්‍යතාවය[3]'' නිර්දේශ කර ඇත.

මම ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාංශයේ ( ONUR ) වැඩ කටයුතුවලින් දිරිමත් වූයෙමි. 2017 ශ්‍රී ලංකාවේ සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙන්[4] සමානාත්මතාවය, මානව අයිතිවාසිකම්, යුක්තිය සහ නීතියේ ආධිපත්‍යය මෙන්ම ජාතික සංහිඳියාව සහ සහජීවනය සඳහා සමස්ත යොමුවක් වෙනුවෙන් විවිධත්වය ඇතුළත් යහ භාවිතා මාර්ගෝපදේශ ඉදිරිපත් කරයි. ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාංශය ගැටුම පරිණාමය කිරීමෙන් දැනුවත් භාවය නගා සිටුවීමට ආගමික නායකයන්, තරුණයන්, ආණ්ඩුවේ නියෝජිතයන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් එකට එක් කරවන ''අතීතය සුවපත් කරමු, අනාගතය ගොඩ නගමු'' යනුවෙන් හැඳින්වෙන ව්‍යාපෘතියක් දියත් කර ඇත. එය සාමය ගොඩනැගීමට සහ සංහිඳියා ක්‍රියාවලිය සඳහා විශේෂිත කමිටුවක් ද පත් කර ඇත.

බිම් මට්ටමේ දී අන්තර් ආගමික එකමුතුව ඇති කිරීමට විවිධ ආගම්වලට අයත් ආගමික නායකයන් ක්‍රියාත්මකව එකට එක්ව සිටිනු මම දුටුවෙමි. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලයේ සහ කරිටාස් ශ්‍රී ලංකා ආයතනයේ අන්තර් ආගමික මණ්ඩපයේ සහායෙන් ක්‍රියාත්මක වන දිස්ත්‍රික් අන්තර් ආගමික කමිටු ගණනාවක් පවතී. සිවිල් සමාජය ද ආගමික හෝ විශ්වාසයේ නිදහස ප්‍රවර්ධනය කිරීමට ඉතා උද්‍යොගිමත් වැඩ කොටසක් ඉටු කරයි.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසුව ප්‍රචණ්ඩ මැර කණ්ඩායම් හෝ වෙනත් බලපෑම් නිසා අවතැන් වූ සරණාගතයන්ට සහ දේශපාලන රැකවරණ පතා පැමිණියන්ට තාවකාලික රැකවරණය ලබා දීමෙන් දැක් වූ ආණ්ඩුවේ ප්‍රතිචාරය පැසසුමට ලක් විය යුතුය. ඉතිරි වී සිටින පවුල් ද නැවත පදිංචි කරවන තෙක් මෙම පියවර පවත්වා ගනු ඇතැයි මම අපේක්ෂා කරමි.

### 3. ආගම හෝ විශ්වාසය පිළිබඳ නිදහසේ අයිතියට ඇති ප්‍රධාන අභියෝග ( FORB )

ආගම හෝ විශ්වාසයේ නිදහසට ඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයේ බැඳීමට නීතිය තුළ ආගම හෝ විශ්වාසය භුක්ති විඳීම සඳහා පුද්ගලයන්ට ඇති අයිතියට ගරු කිරීමේ නිෂේධාත්මක බැඳීම සහ තුන්වැනි පාර්ශ්වයන්/රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් මෙම අයිතීන් කඩ කිරීමෙන් ආරක්ෂා කිරීමේ සාධනීය බැඳීම යන දෙකම අයත් ය. පසුව කී කාරණයට මෙම අයිතීන් භුක්ති විඳීම පහසු කරවීමේ වැඩ පිළිවළ ද ඇතුළත් ය. පළමු බැඳීම් සමුදාය, එනම් ආගම හෝ විශ්වාසයට ඇති තම නිදහස භුක්ති විඳීමට පුද්ගලයන් ගේ හැකියාවට රාජ්‍යයේ මැදිහත්වීම පිළිබඳව කනස්සල්ල මතු කර ඇති අතර මෙම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති ප්‍රධාන අභියෝග ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වන්නේ අයිතිවාසිකම් දරන්නන් කෙරේ ඇති සාධනීය බැඳීම් සපුරාලීමට රාජ්‍යය අපොහොසත් වීමෙනි.

රාජ්‍යය, සිතීමේ හෘද සාක්ෂියේ සහ ආගම හෝ විශ්වාසයේ නිදහසට බාධා කරන බවක් නොපෙනෙන අතර ආගමික බහුත්වවාදය වැළඳ ගැනීමේ දීර්ඝ කාලීන සම්ප්‍රදායක් මෙම රටේ පවතී. කෙනෙකුගේ ආගම හෝ විශ්වාසය දැරීම, වෙනත් එකක් වැළඳ ගැනීම හෝ වෙනස් කිරීම පිළිබඳව පුද්ගලයෙකුගේ තේරීම ශ්‍රී ලංකාවේ නීතියෙන් සහතික කර ඇත. පුළුල් වශයෙන් එය අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූල වේ.

---

[2] ශ්‍රී ලංකාවේ වාර්ගික සහ ආගමික සාම්‍යය තහවුරු කිරීම අධ්‍යයනය කිරීමට සහ එහි නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පත් කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ අන්තර්වාර වාර්තාව බලන්න:https://www.parliament.lk/uploads/comreports/1554456616036598.pdf#page=51

[3] බලන්න දියවන්නා ප්‍රකාශනය:https://www.parliament.lk/en/committee-news/view/1701

[4] බලන්න ශ්‍රී ලංකාවේ සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය:http://nirmin.gov.lk/web/images/pdf/national-policy-english.pdf

කෙසේ වුවත්, ආගම හෝ විශ්වාසය ප්‍රකාශයට පත් කිරීම පිලිබඳව රජය විශේෂිත සීමා කිරීම් පනවන්නේ නැති වුවද, එක ආගමික ප්‍රජාවකින් වෙනත් ප්‍රජාවක් කෙරේ නුරුස්නා බව දැක්වෙන ක්‍රියාවන් සහ එවැනි එදිරිවාදුකම්වලට ලක්වෙන පුද්ගලයන් හෝ ප්‍රජාවන් ආරක්ෂා කිරීමට රාජ්‍යය අපොහොසත්වීමේ වාර්තා නිරන්තරයෙන්ම පවතී. මුස්ලිම් ප්‍රජාව සහ විශේෂයෙන් නව ක්‍රිස්තියානි පල්ලි හිරිහැර කිරීම් සහ පහරදීම්වලට බොහෝ විට මුහුණ දේ. ඊට පුද පූජා පැවැත්වීමට බාධා කිරීම, පූජ්‍යස්ථානවලට හානි කිරීම, පූජකවරුන්ට ශාරීරිකව පහරදීම, බිය ගැන්වීම ප්‍රජාව හෝ පූජකවරුන් කෙරේ මැර කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය මුදා හැරීම, ක්‍රිස්තියානි පල්ලි හෝ මුස්ලිම් පල්ලි ලියාපදිංචි කිරීමට ඉල්ලා සිටීම, පුද පූජා කරන ස්ථාන භාවිතා කිරීම සීමා කිරීම, අවමගුල් උත්සව හෝ සූසාන භූමි වලට පිවිසීමට සීමා කිරීම වැනි ආගමික වතාවත්වලට බාධා කිරීම, ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීම සහ තවත් බොහෝ නොඉවසන බව දැක්වෙන ක්‍රියා ඇතුළත් වේ.

මුස්ලිම් ප්‍රජාව අප්‍රේල් බෝම්බ ප්‍රහාරවලින් පසුව ප්‍රචණ්ඩත්වයට වැඩියෙන් මුහුණ දෙති. කලින් දැක්වූ මුක්තිය නිසා මුස්ලිම් විරෝධී කණ්ඩායම් ධෛර්යමත් වී ඇත. මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයට දක්වන ලද දුර්වල සහ සම්බන්ධීකරණයක් නැති ප්‍රතිචාර නිසා රටේ සමහර කොටස්වල පුද්ගලයන් සහ ප්‍රජාවන්ට එල්ල වෙන ප්‍රචණ්ඩත්වය සහ ප්‍රහාර වැඩි වූ බව පෙනේ.

**<u>වෙනත් ආගමකට ඇතුළත් කර ගැනීම සහ වැළඳ ගැනීමේ අයිතිවාසිකම</u>**

මා සමග කතාබහ කළ අයගෙන් දැන ගැනීමට ලැබුණ ආකාරයට ශ්‍රී ලංකාවේ ආගමකට බඳවා ගැනීමේ අයිතිවාසිකම ගරු කරන්නේ හෝ ආරක්ෂා කරන්නේ නැත. 2003 දී සහ 2017 දී ශ්‍රේෂ්ඨාධිකරණය කෙනෙකුගේ ආගම 'ප්‍රචාරය කිරීමේ' අයිතිවාසිකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර නැතැයි තීරණය කෙළේය. මෙම තීරණය තම ආගම හෝ විශ්වාසය අනෙක් අය සමග හුවමාරු කර ගැනීම අවශ්‍ය කෙරෙන ආගම් අදහන බොහෝ දෙනකුට බලපෑමක් විය. එම කාර්ය සඳහා සුදුසු ස්ථානවලදී කෙනෙකුගේ ආගම හෝ ඉගැන්වීමට අදාල ප්‍රකාශන ලිවීම, නිකුත් කිරීම හෝ පතුරුවා හැරීම ආගම හෝ විශ්වාසය ප්‍රකාශනය සහ විද්‍යාමානතාවය පිළිබඳ නිදහසේ කොටසක් බව පැහැදිලි කළ යුතුය. එය අන්තර් ජාතික නීතිය යටතේ ආරක්ෂා කර ඇත.

රෝමානු කතෝලික නොවන ක්‍රිස්තියානි භක්තිකයන් සහ මුස්ලිම් ආගමිකයන් කෙරේ එදිරිවාදුකම් හට ගැනීමට පදනම් වී ඇත්තේ වෙනත් ආගමකට හැරීම ස්ථාපිත අධිකාරියට තර්ජනයක් විය හැකිය යන්න හෝ එවැනි ප්‍රයත්නයන් කිසියම් ප්‍රදේශයක ප්‍රමුඛ ආගමේ ඉගැන්වීම් හෝ විශ්වාසයන්ට අපහාසයක්' වනු ඇතැයි යන බියක් මතය. නොරිස්සුම් භාවය පෙන්නුම් කරන වෙනත් අය ආගමකට හැරීම අසරණ මිනිසුන් සූරාකෑමක් වන්නේයැයි පවසමින් තම අගතිය හේතු යුක්ති කිරීමට උත්සාහ කරති.

**<u>නීතියේ සහ භාවිතයේ දී ආගම හෝ විශ්වාසය මත පදනම්ව වෙනස් කොට සැලකීම</u>**

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සහ 14 (1) ඉ වගන්තිවලින් ආගම හෝ විශ්වාසයේ සහ එහි ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කරන අතර සහ 9 වගන්තියෙන් '' බුද්ධාගමට රාජ්‍යයේ ප්‍රමුඛස්ථානය හිමි විය යුතුයැයි'' ප්‍රකාශ කෙරේ. මින් සියලු දෙනාගේම සමානත්වය අවධාරණය කෙරෙන 10 සහ 14 (1) ඉ වගන්තිවලින් මෙන්ම 12 වගන්තියෙන් සහතික වන බැවින් අනෙකුත් ආගම්වලට ලබා දී ඇති ආරක්ෂාවේ අඩුවීමක් නොවන්නේයැයි ආණ්ඩුව තර්ක කරයි. රාජ්‍යයෙන් ලබා දෙන මූලික ආරක්ෂාව අනෙකුත් ආගම්වලට ලබා දී නොමැති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍යයේ ආරක්ෂාව ලබා දිය යුත්තේ බුද්ධාගමට පමණක්යැයි 2003 දී ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කිරීම විවාදාත්මක ය. මෙම ප්‍රතිපාදන සහ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය නිසා අනෙකුත් ආගම් සමාන පදනමකින් සැලකීමට රජයට ව්‍යුහාත්මක වශයෙන් නොහැකියැයි තමන්ට සිතෙන බව මා සමග අදහස් හුවමාරු කර ගත් අය නිරන්තරයෙන් පවසනු මට ඇසිණ.

බෞද්ධයන් අඩු ප්‍රදේශවල පවා විහාර හෝ බුද්ධ ප්‍රතිමා පිහිටුවීමට බෞද්ධ භික්ෂූන්ට රජය අවසර දෙන නමුත් ක්‍රිස්තියානි භක්තිකයන් කීප දෙනකු පමණක් සිටින හෝ බෞද්ධ බහුතරයක් සිටින ප්‍රදේශවල වෙනත් ආගමික ප්‍රජාවන්ට පුද්ගලික නිවසක දී පවා යාඥා මෙහෙයන් නොපැවැත්විය යුතුයැයි පවසන බව මෙම ආගමික ප්‍රජාවන් බොහොමයක් පෙන්වා දුන්හ. ඓතිහාසික ආගමික ස්ථාන සම්බන්ධයෙන් තරගකාරී ඉල්ලීම් පවතින අතර රාජ්‍ය නිලධාරීන් මෙම සිද්ධීන් ගැන ප්‍රමාණවත් ආකාරයෙන් අපක්ෂපාතී නොවන්නේයැයි හැඟීමක් පවතී. කුමන ප්‍රජාවක් වරදක් කරන්නේ ද හෝ ඊය ගොදුරු වන්නේ කවර ප්‍රජාවක් ද යන්න මත නීතිය බලාත්මක කිරීමේ දී දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ප්‍රශ්න බොහෝ දෙනකු විස්තර කළහ. නිදසුනක් වශයෙන් වීඩියෝ පටිවලින් පැහැදිලිව හඳුනා ගත හැකි බහුතර ප්‍රජාව විසින් සුළුතරයට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරන

අවස්ථා තිබුණත් සිද්ධියෙන් පසු වසර ගණනාවක් ගත වුවද විසඳුමක් නොමැතිව පවතින සිද්ධීන් ගැන මට අසන්නට ලැබිණ. ඊට වෙනස්ව බෞද්ධ ප්‍රජාවට අයත් කෙනෙකු පැමිණිල්ලක් ඉදිරිපත් කළ විට කඩිනම් පියවර ගන්නා අතර එය සමහර විට ප්‍රමාණය ඉක්මවා යන බව ද බොහෝ අය පැමිණිලි කළහ. ''ආගමික කැලඹිලි''ඇති විය හැකියැයි සැලකෙන සමහර සුළු සිද්ධීන් ( කල්පිත කතාවක් හෝ ඇඳුමක ඇති සලකුණක්) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික පනත යටතේ ( ICCPR ) අත් අඩංගුවට ගැනීමේ සමහර සිද්ධීන් ගැන මට අසන්නට ලැබුණ අතර 2014 අලුත්ගම කැරලි කෝලාහල තත්වයන් වැනි ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීමේ බරපතළ සිද්ධීන්වලට මුක්තිය ලැබීම ද මට ඇසීමට ලැබිණ.

## ලියාපදිංචි කිරීම

වැඩි දුරටත් ආගමික සංවිධාන හෝ පූජ්‍යස්ථාන ලියා පදිංචි කිරීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශවල ඌනතාවයක් පවතී. ලියා පදිංචි කිරීම බැඳීමක් නොව කිසියම් ආගමික ප්‍රජාවකට නොයෙකුත් ගනුදෙනු සහ කාර්ය සාධනය සඳහා නෛතික පුද්ගල භාවයක් අත් කර ගැනීමට හැකිවනු සඳහා රජයෙන් කරන පිරිනැමීමක් බව සිහිපත් කළ යුතුය. පිළිපැදීමේ සහ විශ්වාස කිරීමේ අයිතිය කිසියම් රජයක අවසරයක් ලබා ගැනීමට ලක් වන්නක් නොවේ. ලියා පදිංචි කිරීමේ ක්‍රියාවලිය අපැහැදිලි, මන්දගාමී බවත්, ලියා පදිංචි කිරීමේ අවශ්‍යතාවයන් පැහැදිලි නැති බවත් කරදරකාරී බවත් සහ එම ප්‍රාදේශීය පොලීසියේ සහ අධිකාරීන්ගේ අධීක්ෂණයට සහ හිරිහැර කිරීම්වලට හේතු වන බවත් සුළුතර ප්‍රජාව පැමිණිලි කරති. පුද පූජා කිරීමට ගෙවල් තැනීමට අවසර ලබා ගැනිම ද ප්‍රාදේශීය ප්‍රජාවේ විරෝධය නිසා ප්‍රතික්ෂේප කළ හැකිය. ලියා පදිංචි නොකළ පුද පූජා පවත්වන ගෙවල් වසා දමා ඇත. නිදසුනක් වශයෙන් ඉදි කිරීම් නිම කළ මුස්ලිම් පල්ලි ගණනාවක් පාවිච්චියට ගැනීමට නොහැකිව පවතින අතර 2014 දී පල්ලි 30ක් වසා දැමීමට බල කළ බව ශ්‍රී ලංකාවේ ජාතික එවැන්ජලික ක්‍රිස්තියානි සන්ධානය වාර්තා කරයි.

## අධ්‍යාපනය

විවිධ ආගමික ප්‍රජාවන්ට අයත් ළමයින් බඳවා ගැනීම සාධාරණ කෝටා ක්‍රමයක් මත පදනම් නොවන නිසා පාසල්වල වෙනස් කොට සැලකීම් පිළිබඳ පැමිණිලි ඇත. විවිධ ආගමික නිකායන් පිළිබඳ තොරතුරු උගන්වන්නේ නැති අතර ශ්‍රී ලංකාවේ ලක්ෂණයක් වන ආගමික බහුත්වය ගැන බාල පරම්පරාව අතර අවබෝධයක් නැත.

## සරණාගතයන්

නීතියේ ආධිපත්‍යය යෙදවීමේ පවතින අඩුපාඩු අවදානම් සහගත තත්වයන් හි සිටින ප්‍රජාවන් සහ පුද්ගලයන් කෙරේ සැලකිය යුතු බලපෑමක් වන බව පෙනෙන්නට ඇත. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසුව මීගමුව ප්‍රදේශයේ සිටින මුස්ලිම් බහුතරයක් ඇති රටවලින් පැමිණි සරණාගතයන් සහ දේශපාලන රැකවරණය පතා පැමිණි අය ඉලක්ක කර ගැනීම, තර්ජනය කිරීම සහ අවතැන් කරවීම සිදු විය. සමහර අය තුන්වැනි රටවල පදිංචි කිරීම හෝ මෙම රටේම වෙනත් ප්‍රදේශවලට යවන ලද අතර පුන්තෝට්ටම් ප්‍රදේශයෙන් යෑමට සිදු වුවහොත් ජීවත්වීමේ මාර්ගයක් අහිමිවන තවත් 55ක් අඩුම වශයෙන් එහි සිටිති. තම ප්‍රජාවට තවත් ප්‍රහාර එල්ල කරනු ඇතැයි බියෙන් සහ අරමුදල් නොමැතිකම නිසා සරණාගතයන්ට සහාය සහ රැකවරණය ලබා දීමට තමන්ට හැකියාවක් නැතැයි සමහර මුස්ලිම් කණ්ඩායම් දුක් වූහ.

## කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම්

ආණ්ඩුව භික්ෂුණී සාසනය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ වාර්තා මට ලැබිණ. භික්ෂුණීන්ට තම උපසම්පදාව ඔවුන්ගේ ජාතික හැඳුනුම් පතේ සඳහන් කිරීමට අවසර නොමැති වුවද භික්ෂුන්ට එම වරප්‍රසාදය පවතී.

කාන්තාවන්ගේ, ප්‍රචණ්ඩත්වය සහ ආකෘතිගත කිරීම ඇතුළත් වාර්ගික ආගමික අත්දැකීම්වලට ප්‍රමාණවත් අවධානයක් හෝ සහනයක් ලැබෙන්නේ නැත. මුස්ලිම් ආගමිකයන් පිළිබඳ බොහෝ කුට උපක්‍රම සහ අපහාසයට පත් කෙරෙන කතාවලින් ඉලක්ක කර ගන්නේ කාන්තාවන් සහ ඔවුන්ගේ ප්‍රජනන හැකියාවන් ය. කාන්තා මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන් තමන්ගේම ආගමික ප්‍රජාවේ මූලධර්මවාදීන්ගෙන් අවදානමට ලක් විය හැකි බව පෙනේ. ඔවුන්ගේ වැඩ, විශ්වාස සහ ආගමික අනන්‍යතාවයෙන් ඔවුන් ආගමික සම්මතයන් උල්ලංඝනය කරන බව පවසන පුරුෂ නායකයන්ගේ ඔවුන් අපහාසයට ලක් වේ.

ආගමික ඉගැන්වීම් LGBTQI+ ප්‍රජාවන් කොන් කිරීමේ වැදගත් සාධකයක් බවත් තම ලිංගිකත්වය සමග ආගමික අනන්‍යතාවය ගැලපීමට උත්සාහ ගන්නා අයට එය ගැඹුරු පුද්ගලික අරගලයක් වන බවත් LGBTQI+ ප්‍රජාවේ සාමාජිකයෝ වාර්තා කළහ. බොහෝවිට LGBTQI+ දැක්ම සහ කාන්තාවන් අන්තර් ආගමික සංවාද සහ සංහිඳියා ක්‍රියාවලියෙන් බැහැර කෙරේ. ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය බලපෑම සැලකිල්ලට නොගෙන වාර්ගික සහ ආගමික දෘෂ්ටි කෝණයකින් සංහිඳියාව සියල්ලන් ඇතුළත් කර ගැනිමක් නොවේ.

අප්‍රේල් බෝම්බ ප්‍රහාරයෙන් පසුව ආණ්ඩුව ප්‍රකාශයට පත් කරන ලද හදිසි නීති රෙගුලාසිවලට ඇතුළත් පියවරක් වන්නේ ප්‍රසිද්ධ ස්ථානවල මුහුණු ආවරණය කර ගෙන සිටීම තහනම් කිරීම ය. මෙය විශේෂයෙන්ම රෝහල්, පාසල් සහ ප්‍රසිද්ධ ප්‍රවාහනය වැනි ආයතනවල දී මුස්ලිම් කාන්තාවන් ආගමිකව පිළිගන්නා ඇඳුම් ඇඳීමේ සිරිත් විරිත් නොඉවසීම ඉහළ යෑමට හේතු වී ඇත. සමහර අය හිජාබ් හෝ අබායා ඇඳ සිටින නිසාම මුස්ලිම් කාන්තාවන් සහ ගැහැනු ළමයින් සමහර රෝහල්වලට හෝ විභාග ශාලාවලට පිවිසීම වළක්වති. නැතිනම් වැඩ කරන ස්ථානයේ දී වාචිකව අවමානයට ලක් කරති. සමහර විට මුහුණු ආවරණ තහනම උල්ලංඝනය කෙළේයැයි සිරගත කිරීම වැනි දැඩි ප්‍රතික්‍රියාවන්ට මුහුණ දීමේ අවස්ථා පිළිබඳ වාර්තා මට ලැබිණ. එය ඉතාමත් දරුණු පියවරකි.

වැඩි දුරටත් සම්පූර්ණ මුස්ලිම් ප්‍රජාවම සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතින් බැහැර කර ඇත. එමනිසා මුස්ලිම් ජනතාවට මුස්ලිම් විවාහ සහ දික්කසාද ආඥාපනතෙන් ( MMDA ) බැහැර වීමට හෝ ඇතුළත්වීමට විකල්පයක් නැත. මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ක්‍රියාත්මක කිරීම දිගු කලක් තිස්සේ ස්ත්‍රීපුරුෂ සමාජ භාවීය සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටින්නන්ගේ කනස්සල්ලට යොමු වූ කරුණකි. එමෙන්ම නීතියේ වාස්තවික ලක්ෂණ සහ එහි පරිපාලනය යන දෙකම පුනරීක්ෂණ ගණනාවකට විෂය විය. ෂාරියා නීතියේ පීතෘ මූලික කියවීම් මත පදනම්ව මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත එක්සත් ජාතීන්ගේ සිඩෝ (CEDAW ) සන්ධානයෙන් දැක්වෙන ඒවා ඇතුළත්ව අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය උල්ලංඝනය කරයි. වැඩි දුරටත් එම නීතිය අනුව විවාහ ආරවුල් විසඳීමට කාති උසාවි පිහිටුවන නමුත් කාන්තාවන්ට කාති උසාවියේ විනිශ්චයකරුවන් වීමට ඉඩ නොමැත. කෙසේ වුවත් මුස්ලිම් විවාහ සහ දික්කසාද නීතියේ දීර්ඝ කාලයක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටි ප්‍රතිශෝධන මෑතකදී ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

## 4. ආගමික අන්තවාදය සහ ආගම දේශපාලනීයකරණය වීම

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාව ඉස්ලාමීය අන්තවාදයේ ගෝලීය ප්‍රවනතාවයේ වින්දිතයෙකුව ඇතැයි මාධ්‍යයෙන් දක්වා තිබිණ. ආණ්ඩුව තුළ පවා විවිධ ආකාරයේ ආගමික අන්තවාදය රටේ පවතින ප්‍රශ්නවලට පදනම් වූ බවට පිළිගැනීමක් නැත. ඒ වෙනුවට ඔවුන් සඳහන් කරන්නේ ''ඉඳහිට සිදුවන කුඩා සිද්ධීන්'' ගැනය. කෙසේ වුවත් මා කතා කළ සංවාදයට එක් වූ බොහෝ දෙනකු කලක සිටම බෞද්ධයන් ඇතුළත් විවිධ ආගමික නායකයන්ගේ අන්තවාදී අදහස්වල බලපෑම ගැන දැනටමත් දැඩි කනස්සල්ලට පත්ව සිටිති. ඇරත් සමහර දේශපාලනඥයන්, විශේෂයෙන් මැතිවරණ සමයේ දේශපාලන වාසි තකා සිතා මතාම ආගම උපයෝගි කර ගැනීම ගැන කනස්සල්ල පළ කළහ.

ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමට ආගමික අන්තවාදය යොදා ගෙන ඇති නිසා එවැනි අන්තවාදයේ මූලයන් වූ හේතු හඳුනා ගැනිම සහ ඊට ප්‍රතිචාර දැක්වීම වැදගත් විය හැකිය. රැඩිකල්වීමේ ක්‍රියාවලිය විවාදයට ලක් වුවද, අනාරක්ෂාව, අයුක්තිය, අසමානතාවය සහ කොන් කිරීම පිළිබඳ හැඟීම මෙන්ම විශේෂයෙන්ම ආණ්ඩුවේ ආයතන පිළිබඳව ඇති විශ්වාසය යටපත් කෙරෙන ආකාරයට නිරන්තරයෙන්ම නීතියේ ආධිපත්‍යය හිතුවක්කාර ලෙස යෙදවීම යහපාලනයේ ඌනතාවයකි. වැඩි දුරටත් මෙවැනි ආතතීන් 2014 සිට අවස්ථා කීපයකදීම වූ ආකාරයට කුඩා අඬ දබරයක් හෝ සිද්ධියක් මහා ගින්නක් අවුලන පුළිඟුවක් විය හැකිය. අන්තවාදයට සහ බියට එරෙහිව සමාජයේ ඔරොත්තු

දීමේ ශක්තිය ගොඩ නැගීමට යහ පාලනය, සියලු දෙනාගේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ප්‍රජාවන් අතර සම්බන්ධතා ගොඩ නැගිම මත පදනම් වූ පුළුල් පදනමක් සහිත පිවිසුමක් අවශ්‍ය ය.

### 5. වාර්ගික සහ ආගමික අනන්‍යතාවය

මා සමග පැවැත් වූ බොහෝ සංවාදයන්හි දී ජනතාව තමන් හඳුනා ගත්තේ මුස්ලිම්, සිංහල හෝ දෙමළ වශයෙනි. නැතිනම් ඔවුන් හඳුන්වා ගත්තේ බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හෝ මුස්ලිම් වශයෙනි. ආගම සහ වර්ගය හා සමීපව සම්බන්ධ වූ ගැඹුරටම මුල් බැස ගත් අනන්‍යතා දේශපාලනයක් පවතින බව පැහැදිලි ය. ආගම හෝ විශ්වාසයේ නිදහස අනුව බලන විට අනන්‍යතා දේශපාලනයේ පහත සඳහන් අනතුරු පවතී.

අ) පුද්ගල අයිතිවාසිකම් හෝ නිදහස අභිබවා ආගමක හෝ වාර්ගිකත්වයේ ප්‍රජා වුවමනාව වඩාත් අවධාරණය කිරීම

ආ) විශේෂිත ප්‍රදේශයක බහුතරයට ප්‍රමුඛතාවය හෝ වැඩි වටිනාකමක් ලබා දීමෙන් සුළුතරයේ හෝ සමාජයක සම්ප්‍රදායික රටාවෙන් පිළිගත් අනන්‍යතාවයන්ට නොගැලපෙන්නේයැයි සිතෙන අය අයිතිවාසිකම්වලින් කොන් කිරීම.

එවැනි අනන්‍යතා දේශපාලනයක එක් එක් කණ්ඩායම් දේශපාලනික, සමාජයීය හෝ ආර්ථික වශයෙන් සියලු අවකාශයන්හි භෞමික ප්‍රදේශයක් වන බැවින් සාමය ගොඩනැගිම, සහජීවනය සහ ආගමික ඉවසීම හෝ එකමුතුව පිළිබඳ සියලු ව්‍යාපෘති යටපත් කරවනු ඇත. වාර්ගික ආගමික ආතතීන් පිළිබඳ දෝෂාරෝපනයෙන් සැලකිය යුතු කොටසක් සියලු දේශපාලන පක්ෂවල දේශපාලනඥයන් තම බල පදනම් ශක්තිමත් කර ගැනීමේ උත්සාහයක් වශයෙන් ප්‍රජාවන් තුළ විරසකකම නිර්මානය කර උපයෝගි කර ගැනීම නිසා බව දැක්වෙන SCP සොයා ගැනීම් සඳහන් කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවය ආගමික සහ භාෂා විවිධත්වය ඇතුළත් කිසියම් විවිධත්වයක් නියෝජනය කරන බවට පිළිගැනීමක් පවතින අතර සියලු දෙනාට සමාන අයිතිවාසිකම් නීතියෙන් ලබා දී ඇති නමුත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතරට අයත් නොවන ආගමික ප්‍රජාවක සාමාජිකයන්ට, නිල වශයෙන් පිළිගත් ආගම්වල සාමාජිකයන් භුක්ති විඳින ආකාරයට සමාන අයිතිවාසිකම් හිමි බවක් පෙනෙන්ට නැත. පිළිගත් අය අතර පවා විවිධ ප්‍රදේශවල එක් ප්‍රජාවක් අනෙක් අයට වඩා වැඩිනම් අනෙක් ප්‍රජාවන් කොන් කරන ලද බව හෝ බහුතරය විසින් ජනාවාස පිහිටුවා ගැනීමේ අවදානමට ලක්ව සිටින බව ඔවුහු කියති. ඒ ආකාරයටම සමහර ප්‍රදේශවලට නව ආගමික ප්‍රජාවක 'ආක්‍රමණය' ඔවුන් සුදුසු නොවන නිසා පිළිගැනීමට ලක් වන්නේ නැතැයි තර්ක කරති. නැතිනම් නව ආගමික කණ්ඩායම කිසියම් ප්‍රදේශයක ආගමික එකමුතුවට යටපත් කරන්නේයැයි හෝ බහුතර ජනතාවගේ ආගමික හැඟීම්වලට හානි කරන්නේය යන සාවද්‍ය තර්කය යොදා ගනිති.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආගම හෝ විශ්වාසයට ඇති නිදහස මූලික මානව අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇති නමුත් භාවිතයේ දී විශේෂයෙන්ම අයිතිවාසිකමේ සමාජයීය අවබෝධය තුළ අයිතිවාසිකමේ සාමූහික පැතිමානය පුද්ගල අයිතිවාසිකමේ පැතිමානයට වඩා වැඩියෙන් අවධාරණය කරන බව පෙනේ. මෙය වාර්ගිකත්වය සහ ආගම අතර ප්‍රබල බැඳීම් පැවතීමේ හේතුවක් සහ ආගම හෝ ඇදහීමේ නිදහස පිළිබඳ 'ඉවසීමේ' ආකෘතියක් මත විශ්වාසය රැඳවීමේ ප්‍රතිඵලයක් විය හැකිය. එහිදී පුද්ගලයන් අයිතිවාසිකම් සහ යුතුකම් සාකච්ඡා කිරීමට රජය සහ පුද්ගලයන් මත විශ්වාසය රඳවා ඇති ප්‍රජාවක පාර්ශ්වයක් සේ දකී. කෙසේ වුවත් සියල්ලන් ඇතුළත් කර ගැනීම අවශ්‍ය කරන සියලු පුරවැසියන් සඳහා තිරස් සමානාත්මතාවයක් පිළිනොගන්නවා විය හැකිය. එයට වැඩි කැමැත්තක් ඇති හෝ ප්‍රමුඛ ප්‍රජාවට වරප්‍රසාද ලබා දීමත් පුද්ගල අයිතිවාසිකම්වලට වඩා සාමූහික අයිතිවාසිකම්වලට වරප්‍රසාද ලබා දෙනු විය හැකිය.

රට මුහුණ දෙන අභියෝගවලින් එකක් වන්නේ ආගමික ප්‍රජාවන් අතර තිරස් සමානත්වයක් නැතැයි සහ තම අයිතිවාසිකම් ඉල්ලීමට පදනමක් වන තම අනන්‍යතාවයට තර්ජනයක් ඇතැයි යන හැඟීමක් ය. තම අනන්‍යතාවය සහ එම අනන්‍යතාවයට පදනම් වූ වරප්‍රසාද රටේ වෙනස්වන භූ දර්ශනයෙන් තර්ජනයට ලක්ව ඇතැයි කණ්ඩායම් කීපයක් අතර අමනාපයක් පවතී. ඒ අතර බහුතර ප්‍රජාව තමන් බහුතර ප්‍රජාව ලෙස වඩාත් ප්‍රබලව පෙනී නොසිටින්නේ නම් තම තත්වය අනාරක්ෂිතයැයි සිතයි.

## 6. නීතියේ ආධිපත්‍යය නොමැතිවීම, වගවීම සහ මුක්තිය

බොහෝ දෙනා තර්ජනය කිරීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව ප්‍රජාවන් ආරක්ෂා කිරීමට බලධාරීන්ගේ නොහැකියාව හෝ අකමැත්ත දක්වමින් ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රජාවන් ආරක්ෂා කිරීමේ බලධාරීන්ගේ භූමිකාව ගැන පැමිණිලි කළහ. නීතිය බලාත්මක කරන බලධාරීන්ගෙන් බාධාවක් හෝ ප්‍රතික්‍රියාවක් නොමැතිව මැර කණ්ඩායම්වලට විවෘතව සහ පැය ගණනාවක් සුළුතර ජන ප්‍රදේශවල කලහකාරී ක්‍රියාවල යෙදීමට හෝ සමහර කලහකාරී ක්‍රියා දින ගණනක් සිදු වුවද ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට නීතිය බලාත්මක කරන බලධාරීන් අපොහොසත්වීම ගැන සමහරු පුදුමයත් සංවේගයත් පළ කළහ. සමහර අවස්ථාවල මෙම ප්‍රහාර සිදු වූයේ ඇඳිරි නීතිය බලපවත්වන කාලය තුළය. මෙය පසුගිය වසරේ මහනුවර දිස්ත්‍රික්කයේ ද නැවත වරක් මෙම වසරේ මැයි මාසයේ දී බටහිර සහ වයඹ පළාත්වල ස්ථාන කීපයකත් සිදු විය.

සමහරු පොලීසිය පැමිණිලි ආමන්ත්‍රණය කළ ආකාරයේ පවතින්නේයැයි සිතා ගත් අගතිය ගැන කනස්සල්ල පළ කළහ. මෙය විශේෂයෙන් සිදු වන්නේ ප්‍රහාරකයන් බහුතර ජන කණ්ඩායමේ සමාජිකයන් වන අවස්ථාවලදීය. පොලීසිය ඔවුන් ඉදිරිපත් කළ පැමිණිලි ලියා ගැනීමට හෝ විමර්ශනය කිරීමට අපොහොසත්වන අතර තමන්ට එරෙහිව ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේ ආකාරයෙන් ක්‍රියාත්මකවන වුවත් ඔවුන් ප්‍රහාරවල ඉලක්ක බවට පත් වූ විට ඒ ආකාරයෙන් ක්‍රියාත්මකවීමට අපොහොසත්වීම හෝ බෞද්ධ භික්ෂූන් නීතිය කඩ කරන විට ප්‍රතිචාර දැක්වීමට සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි පොලිසියට අදහසක් නැතිවීම ගැනද බොහෝ අය පැමිණිලි කළහ.

ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම නිසා අත් අඩංගුවට ගත් පුද්ලයන් නිදහස් කිරීම සඳහා පොලිසියට දේශපාලනඥයන් විසින් බලපෑම් කෙළේයැයි කියන අවස්ථා ගෙන හැර දක්වමින් දේශපාලනඥයන් නීතිය බලාත්මක කිරීමට බලපෑම් කරන්නේයැයි සමහරු දොස් පැවරූහ. තවත් සමහරු නීතියේ ආධිපත්‍යය සහ මානව අයිතිවාසිකම් යටපත් කරවන ගැඹුරටම කිඳා බැස ඇති මුක්තියේ සංස්කෘතියට දොස් පැවරූහ.

## 7. මාධ්‍යයේ භූමිකාව සහ වෛරී කතා හෝ ප්‍රචාරක ව්‍යාපාර

බොහෝ මුස්ලිම් ජනතාව එරෙහිව වෛරී කතා ප්‍රවර්ධනය කිරීමේ දි සහ ඔවුන්ට එරෙහිව ඒදිරිවාදුකම් කිරීමට සහ වෙනස් කොට සැලකිමට උසි ගැන්වීමේ දි මාධ්‍යයේ භූමිකාව පිළිබඳව පැමිණිලි කළහ. සමහරු සන්ත්‍රාසය දනවන ජනමාධ්‍ය වේදයට දොස් පැවරූ අතර අනෙකුත් අය පුද්ගලයන් සහ කණ්ඩායම් ගැන භීතියක් මැවීමේ දී පුද්ගලීකරණය සහ දේශපාලනීකරණය වූ මාධ්‍යය විශාල භූමිකාවක් ඉටු කරන බව පෙන්වා දුන්හ. බෞද්ධ කාන්තාවන් රහසිගතව වන්ධ්‍යකරණය කෙළේයැයි මුස්ලිම් වෛද්‍ය වෘත්තිකයන්ට එරෙහිව පවතින කතාව දිගටම පවත්වා ගැනීමේ දී මාධ්‍යයේ නිෂේධාත්මක භූමිකාව සමහරු මතු කර දැක් වූහ.

සාවද්‍ය ප්‍රවෘත්ති හරහා බිය ඇති කිරීමෙන් සහ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීමෙන් සමාජ මාධ්‍යය ඉටු කරන භූමිකාව ගැන බොහෝ දෙනකු දැඩි කනස්සල්ල පළ කළහ. 2018 මාර්තු මාසයේ පැවති කල කෝලාහලවලින් පසුව සහ මෙම වසරේ මුල් භාගයේ සිදු වූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරවලින් පසුව ආණ්ඩුව සමහර ජනමාධ්‍ය වේදිකා වසා දැමුවේය. සියලු වෛරී කතා ප්‍රතික්ෂේප කළ යුතු අතර එවැනි කතාවලින් සැබැවටම ප්‍රචණ්ඩ ක්‍රියා හට ගැනීමට ඇති ඉඩ කඩ රඳා පවතින්නේ සන්දර්භය සහ සමස්ත වාතාවරණය මත ය. මුක්තිය, වරප්‍රසාද, දඬුමීමා කර ගැනීම් සහ බැහැර කිරීම්වල සංකලනයක් වෛරී ගිනි පුළුඟුවක් විය හැකිය.

වෙනස් කොට සැලකීම, ඒදිරිවාදුකම් සහ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීම ICCPR පනතෙන් අපරාධයක් ලෙස හැඳින් වුවද මෙම පනත උසි ගැන්වීම්වලට එරෙහිව සුළුතර කොටස් ආරක්ෂා කරන ආකාරයට නොයොදවන බවට බොහෝ දෙනා තර්ක කරති. මෙම පනත යටතේ අත් අඩංගුවට ගත් විට දින 14ක කාලයක් තුළ ඇප ලබා දිය නොහැකිය. ඉන් ප්‍රචණ්ඩත්වයට උසි ගැන්විමේ බරපතළකම දක්වයි. කෙසේ වුවත් මෙම පනත පුද්ගලයන් සහ ප්‍රජාවන් ආරක්ෂා කිරීමට වඩා ආගම් හෝ විශ්වාසයන් විවේචනය හෝ සිදු කෙළේයැයි සිතන අපහාසවලින් ආරක්ෂා කිරීමට යොදා ගනී. එමනිසා ප්‍රජා කොටස් උසි ගැන්වීමට, වෙනස් කොට සැලකිමට සහ ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ වැඩි අවදානමකට පත් විය හැකිය.

වෙනස් කොට සැලකීම, එදිරිවාදුකම සහ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීමේ ඉහළ කඩඉමට ළඟාවන කතා අපරාධයක් සේ සැලකිය යුතු අතර සාධනීය සහ සියල්ලන් ඇතුළත්වන කතා තුළින් වෛරී කතා පිටුදැකීම ඒ හා සමානව වැදගත් ය. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසුව සන්සුන්ව සිටීමට සහ මුස්ලිම් ප්‍රජාවට ප්‍රති ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීමට ආයාචනය කෙරෙන සියල්ලන් ඇතුළත් කතා පිළිබඳ යහපත් නිදසුන් බොහොමයක් පවතින නමුත් ගනු ලැබූ සමහර පියවර මුස්ලිම් ප්‍රජාව වඩාත් ගැරහීමට ලක් කරන ඒවා බව පෙනේ.

නිතර ඉදිරිපත් වූ පැමිණිල්ලක් වූයේ වෛරය සහ සාවද්‍ය තොරතුරු සකස් කිරීමේ මාධ්‍ය සහ සමාජ මාධ්‍යයේ භූමිකාව, සුළුතර ප්‍රජාව ආරක්ෂා කිරීමට පොලිසිය අපොහොසත්වීම සහ වරද සිදු කරන්නන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකියාව යි. මෙවැනි අනුෂංගික ප්‍රචණ්ඩත්වය නැවත නැවත සිදුවීම මුස්ලිම් කණ්ඩායම් අතර බිය ජනක වාතාවරණයක් ඇති කළ අතර එය ආමන්ත්‍රණය නොකළහොත් මුස්ලිම් ප්‍රජාව මෙරටින් නික්ම යෑමට හේතුවක් විය හැකිය.

## 8. නිගමන සහ වහාම සැලකිල්ල යොමු කළ යුතු නිර්දේශ

ශ්‍රී ලංකාවේ ආගමික එකමුතුව සහ සහජීවනය පිළිබඳව පවතින දීර්ඝ කාලීන සම්ප්‍රදායන් රටේ නූතන සන්දර්භයේ ඇති අභියෝග ආමන්ත්‍රණය කිරීමට ශක්තිමත් කළ යුතුය. එය ආගම දේශපාලනීකරණයේ වැඩිවීම, වාර්ගික ආගමික අනන්‍යතාවය පදනම්ව වෙන් කරන ලද අධ්‍යාපනය තුළින් ප්‍රජාවන් ධ්‍රැවීකරණය, පුද්ගලික විද්‍යුත් මාධ්‍යවලට සන්නිවේදනය සඳහා නියාමනය නොවන අවකාශ විවෘතවීම, බහුතරයට ලැබී ඇතැයි සිතන වරප්‍රසාදවලට එරෙහිව කැකෑරෙමින් පවතින විරෝධය, වරින් වර නීතිය බලාත්මක කරන ආකාරය වෙනස්වීම නිසා අපේක්ෂා භංගත්වය වැඩිවීම සහ ආගමික අන්තවාදයේ පැතිරීමෙන් විද්‍යාමාන වේ.

ආගම හෝ ඇදහීමේ නිදහස සඳහා ඇති ආරක්ෂාව පිළිබඳව සමහර ව්‍යතිරේකයන් තිබුණ ද ආගම හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් පිළිබිඹු වේ. මූලික වන්නේ විශ්වාසයේ සීමා මායිම් හරහා ආගම් ප්‍රචාරය කිරීමට ලබා දෙන ආරක්ෂාව සහ විශේෂයෙන්ම කාන්තාවන්ට එරෙහිව භාවිතයේ දී වෙනස් කොට සැලකීමට එරෙහිව ඇති තහවුරු කිරීම්වල ඌනතාවයන්ට අදාලව ය. කෙසේ වුවත් නිතිමය ආරක්ෂාවන් විශේෂයෙන්ම වෙනස් කොට සැලකීම, එදිරිවාදුකම සහ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීම තහනම් කිරීම සම්බන්ධයෙක් සහ සුළුතර ආගමික ප්‍රජාවන්ට එරෙහිව සැබැවින්ම සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීමේ පවතින වරින් වර වෙනස්වන ස්වභාවයෙන් යටපත් කෙරේ.

විරුද්ධාභාෂයක් ලෙස ආගමික ප්‍රජාවන් අතර යහපත් සම්බන්ධතා සහ එකමුතුව පවත්වා ගැනීමට සැලසුම් කරන ලද ප්‍රතිපාදනයක්, එනම් ආගමකට අපහාස කිරීම අපරාධයක් සේ හැඳින්වීම ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති අයිතිවාසිකම අනුව ප්‍රශ්න සහගත වනු පමණක් නොව ආගම හෝ විශ්වාසය පදනම් අන්තවාදී ඉගැන්වීම්වලට අභියෝග කිරීමේ හැකියාව බැහැර කිරීමෙන් ඉවසීමේ වාතාවරණයක් ගොඩ නැගීමේ උත්සාහයට බාධාවක් විය හැකිය.

සවිස්තරාත්මක නිර්දේශ මගේ අවසාන වාර්තාවට ඇතුළත් වනු ඇත. එහෙත් මැතිවරණයට පෙරාතුව මූලික නිදහස භාවිතා කිරීම හැකි කරවන වාතාවරණයක් නිර්මාණය කිරීමට විශේෂයෙන්ම වැදගත් විය හැකි, පහත සඳහන් නිර්දේශ, ඉදිරිපත් කිරීමෙන් මගේ මූලික සොයා ගැනීම් අවසන් කරනු කැමැත්තෙමි.

- රජය ප්‍රචණ්ඩත්වයට සහ ප්‍රචණ්ඩත්වයට උසි ගන්වන්නන්ට නඩු පැවරිය යුතුය. වෛරය පතුරුවන ජාලයන් ඉවත් කර වෛරී අපරාධවල වින්දිතයන්ට යුක්තිය ලබා ගැනීමට පහසුකම් සැපයිය යුතුය.
- රජය අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයට වෛරී කතා අධීක්ෂණය කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට පද්ධති සහ යාන්ත්‍රණ ගොඩ නැගිය යුතුය. එක්සත් ජාතීන්ගේ පද්ධතියෙන් ගොඩ නගන ලද මෙවලම් ගණනාවකින්ම ලබා දී ඇති මාර්ගෝපදේශ, වෛරී කතාවලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ රබාත් ක්‍රියාත්මක සැලැස්ම සහ මහා ජනතා කුරිරු ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ෆෙස් ක්‍රියාත්මක සැලැස්ම, නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් පුහුණු කිරීමේ දී යොදා ගැනීමට අගනේය. මෙම මෙවලම් මාධ්‍යවේදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, ආගමික නායකයන් සහ දේශපාලන නායකයන් අතර බෙදා හැරිය යුතුය.

- ඉහත සඳහන් මෙවලම්වලින් නිර්දේශ කර ඇති ආකාරයට ආණ්ඩුවේ නායකයන් සහ ආගමික නායකයන් වෛරී ඉගැන්වීම්වලට එරෙහිව කතා කළ යුතු අතර සුළුතර ප්‍රජාවන් සහ අවදානම් සහිත තත්වයක සිටින පුද්ගලයන් කොන් කිරීමේ සහ අවමානයට ලක් කිරීමේ උත්සාහයන් ප්‍රතික්ෂේප කළ යුතුය.
- සියල්ලන් ඇතුළත් අනන්‍යතා ගොඩ නැගීම සඳහා අධ්‍යාපන පද්ධතියේ හදිසි ප්‍රතිශෝධනවලට මුල පිරිය යුතුය. අන්තර්ජාතික බැඳීම් අනුව ශ්‍රී ලංකාව අවබෝධය, සාමය, ඉවසීම, ස්ත්‍රීපුරුෂ සමානත්වය සහ සියලුම ජාතීන්, වාර්ගික සහ ආගමික කණ්ඩායම් සහ ආදිවාසි සම්භවයකින් යුත් පුද්ගලයන් අතර මිත්‍රත්ව පීව ගුණයකින්, නිදහස් සමාජයක වගකීමෙන් යුත් ජීවිතයක් සඳහා ළමයින් සූදානම් කරන ආකාරයට අධ්‍යාපන අයිතිය සපුරාලිය යුතුය.[5]
- රජය වෙනත් කරුණු අතර සුළුතර ප්‍රජාවන් දිරිමත් කරවන, ඔවුන් සමග සම්බන්ධතා ගොඩ නංවන, අන්තර් ආගමික සංවාදය ප්‍රවර්ධනය කරන ව්‍යාප්ති වැඩ සටහන් පැවැත්වීම ඉල්ලා සිටින මානව අයිතිවාසිකම් කවුන්සලයේ 16/18 යෝජනාව ඇතුළත් ක්‍රියාත්මක සැලැස්මෙන් හඳුනා ගත් කරුණු නීති ගත කිරීමට සලකා බැලිය යුතුය.
- රජය බීරුට් ප්‍රකාශනය සහ අන්තර් ආගමික සංවාදය ප්‍රවර්ධනය කිරිමට සැලසුම් කළ ක්‍රියාකාරකම්වල විශ්වාසයේ අයිතිවාසිකම් පිළිබඳ කැපවීම් 18 යොදා ගත යුතුය. එවැනි සංවාදයන්ට ආගමික නායකයන් පමණක් නොව කාන්තාවන් සහ ආගමික සුළුතරයන්හි සාමාජිකයන් සහ ආගමික නොවන අය ඇතුළත් සාමය ගොඩ නැගීම සහ මානව අයිතිවාසිකම් ප්‍රගමනය සඳහා වැඩ කරන ආගමික ක්‍රියාකාරීන් එකට එක් කරන සියලු ප්‍රජාවන්ගේ ස්වේච්ඡා සහභාගිත්වය සමග සියල්ලන් ඇතුළත් කර ගත යුතුය.
- සමාජ මාධ්‍ය වේදිකා ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු ලබා ගැනිමේ නිදහස ආරක්ෂා කරන අතර ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීම් අධීක්ෂණය සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ගැන වඩාත් කැප විය යුතුය.

[5] CRC Article 29 (1)d and 1981 Declaration Art 5.3